SCAN

# එකොළහ වසර සිසු සිසුවියන්ගේ සිංහල භාෂාව ලිවීමේ දුර්වලතා හා ඒවා කෙරෙහි බලපාන සාධක පිළිබඳ අධ්‍යයනයක්

(බණ්ඩාරවෙල අධ්‍යාපන දිස්ත්‍රික්කයේ
වැලිමඩ අධ්‍යාපන කොට්ඨාශයේ පාසල්
ආශ්‍රිතව කෙරෙන අධ්‍යයනයකි.)

ඩබ්ලිව්.ඇම්. සුමනපාල
(බී.ඒ.,අධ්‍යාපන ඩිප්ලෝමා - සම්මාන)

REFERENCE ONLY

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ
අධ්‍යාපනපති උපාධිය සඳහා
ඉදිරිපත් කෙරෙන පර්යේෂණ
නිබන්ධනය

1995 නොවැම්බර්

64687

# සංක්ෂේපය

මිනිස් වර්ගයා අදහස් ප්‍රකාශ කරන ප්‍රධාන මාධ්‍යය භාෂාවයි. අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයේදී සිංහ භාෂාව හා සාහිත්‍ය ප්‍රශ්න පත්‍රයෙන් බොහෝ විට කෙරෙනනේ සිංහල භාෂාව ලවීමේ හැකියාව මැන බැලීමයි. සවන්දීම, කථනය, කියවීම හා ලිවීම යන චතුර්විධ කුසලතාවයන් භාෂා කාර්යයන් ලෙස අදහස් කළද, විභාග අපේක්ෂිත සිසුන්ගේ සාධනය මැනීමට බොහෝවිට යොදා ගන්නේ ලිවීමයි. ලංකාවම පොදුවේ බලන -විට වසරකට අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සිංහල භාෂාව හා සාහිත්‍ය 20% ක් පමණ අසමත් වන බව විභාග කොමසාරිස්ගේ ඇගයීම් වාර්තා අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වූ කරුණකි. තවද සිංහල භාෂාව ලිවීමේ දුර්වලතා ගැන සෙවීමේ පර්යේෂණ මෙතෙක් කර නොමැතිවීමද, මෙම අධ්‍යයනයට මග පෙන්වන්නක් විය. මෙම පසුබිම යටතේ සිංහල භාෂාව ලිවීමේ දුර්වලතා අනාවරණය කිරීම, ඒවාට බලපෑ හේතු හා ඒ සඳහා විසඳුම් යෝජනා ඉදිරිපත් කිරීමේ අපේක්ෂාවෙන් බණ්ඩාරවෙල අධ්‍යාපන දිස්ත්‍රික්කයේ වැලිමඩ අධ්‍යාපන කොට්ඨාශයේ පාසල් සිසුන් ආශ්‍රිතව කෙරෙන අධ්‍යයනයකි; මෙය.

ලිවීම යනු චතුර්විධ භාෂා කුසලතාවලින් එකකි. කථනය, ශ්‍රවණය හා කියවීම මෙම අධ්‍යයනයට යොදා නොගැනේ. එසේ නමුත්, ලිවීමේදී අනෙකුත් භාෂා හැකියාවන්ද, ඉවහල්වන බව අමතක නොකළ යුතුය. ලිවීම පිළිබඳ ගැඹුරින් සොයා බැලීමක් කළයුතු හෙයින් මෙහිදී ලිවීම ගැන පමණක් අධ්‍යයනයට ලක් කෙරේ.

භාෂාව ලිවීමේ දුර්වලතා ලෙස අධ්‍යයන කිරීම සඳහා අවධානය යොමු කරනු ලැබුවේ, ප්‍රස්තුතයට උපයෝගීවන නිවැරදි උත්ත ආඛ්‍යාත පද සම්බන්ධ රීති වලට අනුකූලව වාක්‍ය ලිවීමේ නොහැකියාව, පැහැදිලිව හා නිවැරදිව ක්‍රමවත් අත් අකුරු වේගවත්ව ලිවීමේ හැකියාවක් නොදැක්වීම, සම්ප්‍රදායික යෙදුම් වාග්මාලාව අන්තර්ගත පද පිළිබඳ අවබෝධය දුර්වල මට්ටමක පැවතීම, ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අවබෝධ කරගෙන පිළිතුරු ලිවීමේ නොහැකියාව සහ නිර්මාණාත්මක ..

ලේඛනයේදී දුර්වලතා දැක්වීම යනාදියයි.

මෙහි පර්යේෂණ ක්‍රමවේදය ලෙස භාවිතා කරනු ලැබුවේ සමීක්ෂණ අධ්‍යයන ක්‍රමයයි. පර්යේෂණයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා වැලිමඩ අධ්‍යාපන කොට්ඨාශයේ සිංහල මාධ්‍ය පාසල් 41 කින් පාසල් 10 ක දුර්වල සිසුන් 25 ක පර්යේෂණ නියැදිය ලෙස තෝරා ගන්නා ලදී. පර්යේෂණ තොරතුරු ලබාගැනීම සඳහා උපකරණ ලෙස පරීක්ෂණ, ප්‍රශ්නාවලි, සම්මුඛ සාකච්ඡා සහ නිරීක්ෂණ ක්‍රම භාවිතා කරන ලදී. ඉහත උපකරණ මගින් රැස්කර ගන්නා ලද, කරුණු වලින් ලිවීමේ දුර්වලතා අනාවරණය කර ගැනීමට, ඒ කෙරෙහි බලපෑ සාධක හා විසඳුම් යෝජනා කිරීම අපේක්ෂා කරන ලදී. දත්ත විශ්ලේෂණයේදී ගුණාත්මක විශ්ලේෂණය යොදා ගන්නා ලද අතර, අවශ්‍ය තැනවල ප්‍රමාණාත්මක ( සංඛ්‍යා වද්‍යාත්මක) විශ්ලේෂණ ක්‍රමයද යොදා ගන්නා ලදී.

පර්යේෂණය තුළින් අනාවරණයවූ දුර්වලතා සංක්ෂිප්තව මෙසේ දැක්විය හැකිය. වාක්‍ය ගැළපීමේ දුර්වලතා මතුවීම, අත් අකුරු පැහැදිලිව හා නිවැරදිව ලිවීමේ දෝෂ, පද පිළිබඳ අවබෝධය දුර්වලවීම, ගද්‍ය හා පද්‍ය පාඨ කියවා පිළිතුරු ලිවීම ප්‍රශස්ත මට්ටමක නොවීම හා නිර්මාණාත්මක ලේඛනයේදී දක්වන දුර්වලතා යනාදියයි.

මෙම දුර්වලතාවන්ට බලපෑ ප්‍රබල සාධක ලෙස අනාවරණය වූයේ සිසුන්ගේ පවුලේ ආර්ථික සමාජ මට්ටම යහපත් නොවීම, සන්නිවේදන ක්ෂේත්‍රයේ බලපෑම සංවර්ධනාත්මක නොවීම හා පාසල් පරිසරයේ බලපෑමයි.

ඒවා මගහරවා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනා අතර, භාෂා ගුරුවරුන්ගේ පුහුණුව විධිමත් කිරීම, දුර්වල ළමුන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම, සිසුන් නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල යෙදවීම ප්‍රධාන වේ.